# බහු විෂයයික පර්යේෂණ සම්මන්ත්‍රණය - 2024
# පුස්තකාලය, කැලණිය විශ්වවිද්‍යාලය

**හැඳින්වීම:**

පුස්තකාල සහ ඒවායෙහි ඇති ද්විතීක මූලාශ්‍ර ඇසුරින් සිදුකරන පර්යේෂණ දිරිමත් කිරීමේ අරමුණින් කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාලය විසින් මෙම බහු විෂයයික සම්මන්ත්‍රණය සංවිධානය කරනු ලැබේ. මෙම බහු විෂයයික පර්යේෂණ සම්මන්ත්‍රණය සඳහා ලංකාවේ උසස් අධ්‍යාපන ආයතනයන්හි ඕනෑම පීඨයක අධ්‍යයන කාර්ය මණ්ඩලය, පර්යේෂකයින් සහ පශ්චාත් උපාධි අපේක්ෂකයන්ට සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකා (Full paper) භාරදීම සිදු කළ හැක.

**ලිපි කැඳවනු ලබන විෂය ක්ෂේත්‍ර:**

- කලාව හා මානව ශාස්ත්‍ර
- වාණිජ හා කළමනාකරණ අධ්‍යයන
- විද්‍යාව
- තාක්ෂණය
- වෛද්‍ය විද්‍යාව
- කෘෂි විද්‍යාව
- සමාජීය විද්‍යා

**කතුවරුන් සඳහා නිර්නායක:**

මෙම පර්යේෂණ සම්මන්ත්‍රණය සඳහා ඉදිරිපත් කරනු ලබන සියලූ ම පර්යේෂණ පත්‍රිකා මීට පෙර වෙනත් කිසිදු සඟරාවක, සම්මන්ත්‍රණයක, ප්‍රකාශනයක හෝ කිසිදු මාධ්‍යයක ප්‍රකාශයට පත් නොවූ ඒවා විය යුතු ය. ඔබගේ පර්යේෂණ පත්‍රිකාව බහු විෂයයික පර්යේෂණ සම්මන්ත්‍රණයෙහි විෂය ක්ෂේත්‍රවලට අනුකූල විය යුතු ය. එවැනි පත්‍රිකා පමණක් බහු විෂයයික සම්මන්ත්‍රණයෙහි ශාස්ත්‍රිය සංග්‍රහයෙහි ප්‍රකාශයට පත් කිරීමට නියමිත ය. ඔබගේ පර්යේෂණ පත්‍රිකාව සම්මන්ත්‍රණ කළමනාකරණ පද්ධතිය (Conference Management Tool-CMT ) හරහා ඉදිරිපත් කළ යුතු ය.

**පර්යේෂණ පත්‍රිකාව සම්පාදනයට අදාළ නිර්ණායක:**

1. මෙම බහු විෂයයික පර්යේෂණ සම්මන්ත්‍රණය සඳහා සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකා (Full papers) පමණක් ඉදිරිපත් කළ යුතු අතර පර්යේෂණ පත්‍රිකාවෙහි වචන සීමාව 3000-5000ත් අතර විය යුතු ය (විමර්ශන රහිතව). පර්යේෂණ පත්‍රිකා ඉංග්‍රීසි හෝ සිංහල යන භාෂා ද්විත්වයෙන් ම ඉදිරිපත් කළ හැකි අතර සිංහල බසින් ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ පත්‍රිකා සඳහා සාරසංක්ෂේපය (Abstract) ඉංග්‍රීසි භාෂාවෙන් ඉදිරිපත් කළ යුතු ය. එම සාරසංක්ෂේපයෙහි (Abstract) වචන 250-300ත් අතර සීමා විය යුතු ය. ප්‍රමුඛ පද 3-5 අතර විය යුතු ය.

පර්යේෂණ පත්‍රිකාවේ පිටුවේ ප්‍රමාණය සහ ආකෘතිය : A 4 / MS Word Format
අකුරු වර්ගය : FMAbhaya / Times New Roman

අකුරුවල ප්‍රමාණය : 12
පේළි අතර පරතරය : 1.5
සීමා මායිම : 1" (2.5 cm)
පිටු අංකනය : සෑම පිටුවක් ම අංකනය කළ යුතු ය

**පර්යේෂණ පත්‍රිකාවෙහි මාතෘකාව:** ප්‍රධාන මාතෘකා-14, තදකළු අකුරු (Bold), මැද (Centered)

**කතුවරයා/කතුවරු:** අකුරු ප්‍රමාණය -12, Title case, Justified

**කතුවරයාගේ තනතුරු නාමය:** අකුරු ප්‍රමාණය -12, තද කළු අකුරු (Bold), Left-justified

**ප්‍රධාන මාතෘකා/ව (Main heading/s):** අකුරු ප්‍රමාණය -12, තද කළු අකුරු (Bold), Title case, Left justified

**අනු මාතෘකා/ව:** අකුරු ප්‍රමාණය -12, ඇල අකුරු (Italics), Title case, Left justified

2. පර්යේෂණ පත්‍රිකාවෙහි අන්තර්ගතය සඳහා පහත සඳහන් නිර්ණායක අනුගමනය කළ යුතුය.
   - පර්යේෂණ පත්‍රිකාවෙහි කතුවරයා/කතුවරු, තනතුර, විද්‍යුත් ලිපිනය, ORID ID
   - සාරසංක්ෂේපය (Abstract): සාරසංක්ෂේපයෙහි අනිවාර්යෙන් ම පර්යේෂණ අරමුණු, ක්‍රමවේදය, ප්‍රතිඵල සහ නිගමන/නිර්දේශ (ඇත්නම්) ඇතුළත් විය යුතු ය. වචන 250-300ත් අතර සීමා විය යුතු ය.
   - ප්‍රමුඛ පදඃ 3-5 ඇතුළත් කළ යුතුය.
   - හැඳින්වීම: අධ්‍යයන පසුබිම, සාහිත්‍ය විමර්ශනය, පර්යේෂණ ගැටලුව, අරමුණු හා පරමාර්ථ, පර්යේෂණ ප්‍රශ්න ඇතුළත් විය යුතු ය.
   - පර්යේෂණ ක්‍රමවේදය/පර්යේෂණ ක්‍රම/පර්යේෂණ සැලැස්ම: පර්යේෂණ ක්‍රමෝපායන්, අධ්‍යයන සංගහනය හා නියැදිත සඳහා APA 7 වන සංස්කරණය අනුගමනය කළ යුතුය.

3. රූපසටහන් සහ වගුඃ

   - රූපසටහන්හි මාතෘකාව රූපසටහනට පසුව තිබිය යුතුය.
   - වගුවෙහි මාතෘකාව වගුවට ඉහළින් තිබිය යුතුය.
   - රූපසටහන් සහ වගු අදාළ පෙළ සමඟ තිබිය යුතුය.
   - රූපසටහන් මාතෘකා ඃ Font-12, Bold, Title case, Centered
   - වගු මාතෘකා ඃ Font-12, Bold, Title case, Left-justified
   - වර්ණඃ කළු සහ සුදු

4. පර්යේෂණ අත්පිටපත් පිළිබඳ තීරණඃ

බහු විෂයයික පර්යේෂණ සම්මන්ත්‍රණයට ඉදිරිපත් කරන ලද සියලු ම අත්පිටපත් ද්විත්ව සමියුරු සමාලෝචනයක් (Double-blind Peer Review) සිදු කෙරේ. බුද්ධිමය දේපල අයිතිවාසිකම් උල්ලංඝනය වීම වැළැක්වීම සඳහා අත්පිටපත් රචනා චෞරත්වය පරීක්ෂණ මෘදුකාංගයක් (Plagiarism Detecting Software) මඟින් පරීක්ෂා කරනු ලැබේ. සමානතා අනුපාතය (Similarity Rate) 20%ට සමාන හෝ අඩු විය යුතුය.

5. ප්‍රකාශයඃ

ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ පත්‍රිකාව නව තම පර්යේෂණයක් බවට එකඟ වන ප්‍රකාශ පත්‍රයක් කතුවරුන් විසින් අත්සන් කළ යුතුය. එහි මෙම පර්යේෂණ පත්‍රිකාව මීට පෙර වෙනත් ස්ථානයක ප්‍රකාශයට පත් කර නොමැති බව, එය වෙනත් තැනක ප්‍රකාශනය සඳහා සලකා බලමින් නොපවතින බව සහ ප්‍රකාශන හිමිකම් සහිත තොරතුරු පර්යේෂණ පත්‍රිකාව සඳහා භාවිත කර ඇති බව සඳහන් කළ යුතුය. අවසාන අත්පිටපත පිළිගත් පසු ප්‍රකාශය පිළිබඳ පෝරමය (Declaration form) කතුවරයා වෙත යවනු ලැබේ.

පර්යේෂණ පත්‍රිකාව පිළබඳ අවසන් තීරණ දැනුම් දීම සහ ලියාපදිංචිය පිළිබඳ තොරතුරු Editor-drclib@kln.ac.lk විද්‍යුත් තැපැල ඔස්සේ දැනුම් දෙනු ලැබේ.

ඉහළම ගුණාත්මක ලිපි ලේඛන Desk Research Review and Analysis සඟරාවේ පළ කෙරේ.

**විශේෂිත දින :**

| | |
|---|---|
| පර්යේෂණ පත්‍රිකාව භාරගන්නා අවසන් දිනය | : 2024. 07. 10 |
| පර්යේෂණ පත්‍රිකාව පිළිබඳ තීරණ දැනුම්දීම | : 2024. 07. 30 |
| සංශෝධිත පර්යේෂණ පත්‍රිකාව භාරදීම | : 2024. 08. 24 |
| ලියාපදිංචිය | : 2024. 09. 25 |

**ලියාපදිංචි ගාස්තුව:**

රුපියල් 1500/- (දේශීය)

ඇමරිකානු ඩොලර් 50/- (විදේශීය)

**විමසීම් :**

**ප්‍රධාන සංස්කාරක :**

ආචාර්ය එම්.පී.එල්. මාරසිංහ මිය
070-2695827
Editor-drclib@kln.ac.lk
https://conf.kln.ac.lk/drc/

**කළමනාකරණ සංස්කාරකඃ**

ධම්මික රත්නායක
071-4888898
https://conf.kln.ac.lk/drc